# මහාතණ්හාසංඛය සූත්‍රය (පළමු කොටස)
13.10. 2018 - ශ්‍රී ලංකාරාමය
නවසීලන්තය

නමෝත්තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝත්තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝත්තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

හොඳයි, අද මේ සූත්‍ර දේශනාවෙන් අපි මේ පින්වතුන්ට කියලා දෙන්නා වූ ධර්ම කරුණු ටික ඉතාමත් හොඳින් තේරුම් ගන්න අවබෝධ කරගන්න ලැබේවා කියලා මෛත්‍රීයෙන් ප්‍රාර්ථනා කරනවා. මේක ඉතා දීර්ඝ සූත්‍ර දේශනාවක්. මේකේ තිබෙන්නා වූ කරුණු එක දවසකින් ඉගෙන ගන්න පුළුවන් කමක් නෑ. ඒ උනාට අපි බලමු පුළුවන් විදියට මේකේ තිබෙන කරුණු ටික එකතු කර ගන්න. මේ සූත්‍රය මේ විදියට දිග හැරෙනවා.

| | |
|---|---|
| **එවං මෙ සුතං -** | මා විසින් මෙසේ අසන ලදී. (ආනන්ද ස්වාමීන්වහන්සේගේ ප්‍රකාශනය). |
| **එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ.** | එක් සමයක භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර අනාථපිණ්ඩික සිටුතුමාගේ ජේතවනාරාමයේ වැඩ සිටිනවා. |
| **තෙන ඛො පන සමයෙන** | ඒ කාලයේදී |
| **සාතිස්ස නාම භික්ඛුනො කෙවට්ටපුත්තස්ස** | ඒ කාලයේදී කේවට්ට පවුලෙන් ඇවිල්ලා මහණ වූ සාති කියලා භික්ෂුන් වහන්සේට |
| **එවරූපං පාපකං දිට්ඨිගතං උප්පන්නං හොති -** | මේ විදියට පාපී වූ දෘෂ්ඨියක් පහළ උනා. ඒ තමයි |
| **''තථාහං භගවතා ධම්මං දෙසිතං ආජානාමි** | ''භාග්‍යවතුන් වහන්සේ විසින් මේ අයුරින් දේශනා කරන ධර්මයක් මම දනිමි - |
| **යථා තදෙවිදං විඤ්ඤාණං සන්ධාවති සංසරති අනඤ්ඤ''න්ති.** | එකම විඤ්ඤාණය සංසාරයේ නොවෙනස්ව ගමන් කරයි, අනිකක් නොවෙයි''. |

කෙවට්ටපුත්‍ර වූ සාති භික්ෂුවට පහළ වූ මිත්‍යා දෘෂ්ඨිය තමයි එකම විඤ්ඤාණයක් භවයෙන් භවයට ගමන් කරනවා, වෙන මොකක් වත් නොවෙයි කියන මිත්‍යා දෘෂ්ඨිය. අට්ඨකතාවේ විස්තරයට අනුව මේ හාමුදුරුවෝ ඒ තරම්ම උගත් හාමුදුරුවෝ කෙනෙක් නොවෙයි. සාමාන්‍යයෙන් ජාතක දේශනාවල් කරමින් හිටපු ස්වාමීන්වහන්සේ කෙනෙක්. බුදුරජාණන් වහන්සේ ජාතක දේශනාවල් කරන කොට මේ හාමුදුරුවෝ අහගෙන ඉන්නවා. අපි හිතමු උදාහරණයකට නිමි රජ්ජුරුවෝ ඒ ජීවිතියෙන් නිමි රජ්ජුරුවෝ හැටියට චුත උනා. චුත වෙලා දිව්‍යලෝකයේ ඉපදුනා. දිව්‍යලෝකයේ ඉපදිලා එහෙ හිටියා. ඒ විඤ්ඤාණය තව තැනකට ගියා. ඊට පස්සේ මහෞෂධ පණ්ඩිතයෝ උනා. ඔය විදියට ඒ ඒ තැන් වලට එකම විඤ්ඤාණය තමයි යන්නේ. නමුත් ශරීරය කැඩෙනවා, ශරීරය වෙන් වෙනවා, ශරීරය

දිරනවා. ශරීරය කැඩීලා බිඳිලා ජරාවට ගිහිල්ලා පස් බවට පත්වෙනවා. නමුත් විඤ්ඤාණ එහෙම වෙන්නේ නෑ කියලා.

දැන් ධර්මතා කීයක් තිබෙනවාද? ධර්මතා තිබෙනවා 5ක්. රූප ස්කන්ධය තිබෙනවා. වේදනාව තිබෙනවා. සංඥාව තිබෙනවා. සංස්කාර ස්කන්ධය තිබෙනවා. විඤ්ඤාණ ස්කන්ධය තිබෙනවා. බාහිර මිනිස්සුන්ට හොඳටම පැහැදිලියි මේ ශරීරය බිඳෙවා කැඩෙනවා කියලා. ඊළඟට වේදනාව ගත්තොත් ඒකත් වෙනස් වෙනවා. සැප වේදනා දුක් වේදනා උපේක්ෂා වේදනාව වශයෙන්. සංඥාවලුත් වෙනස් වෙනවා. සංස්කාරයෝත් වෙනස් වෙනවා. එතකොට රූපයයි වේදනාවයි සංඥාවයි සංඛාරයයි වෙනස් වෙනවා. ඒවා වෙනස් උනාට විඤ්ඤාණය වෙනස් වෙන්නේ නෑ. විඤ්ඤාණය වෙනස් නොවී එක දිගට ගමන් කරනවා සැරිසරනවා, දිගට යනවා. ඒ නැතුව වෙන මොකක්වත් නෑ **(සන්ධාවති සංසරති අනඤ්ඤ''න්ති)** මෙන්න මේ විදියට තමයි බුදුරජාණන්වහන්සේ බණ දේශනා කරන්නේ කියලා මේ සාති භික්ෂුවට දෘෂ්ටියක් පහළ උනා. ඒ දෘෂ්ටිය පහළ වෙලා ඒ හාමුදුරුවෝ ඒක හැමතැනම කියමින් යනවා. මේක භික්ෂූන් වහන්සේලාට ආරංචි උනා. මේ ස්වාමීන්වහන්සේ ගැඹුරු ධර්මයක් හදාරලා නෑ. මේ සිද්ධිය වෙන්නේ බුදුරජාණන්වහන්සේගේ කාලයේ.

| | |
|---|---|
| **අස්සොසුං ඛො සම්බහුලා භික්ඛූ** | මේ ගැන බොහෝ භික්ෂූන්වහන්සේලාට අහන්න ලැබුණා, |
| **'සාතිස්ස කිර නාම භික්ඛුනො කෙවට්ටපුත්තස්ස එවරූපං පාපකං දිට්ඨිගතං උප්පන්නං -** | කෙවට්ටපුත්‍ර වූ සාති නම් භික්ෂුවට පහළ වූ මිත්‍යා දෘෂ්ටිය - |
| **'තථාහං භගවතා ධම්මං දෙසිතං ආජානාමි යථා තදෙවිදං විඤ්ඤාණං සන්ධාවති සංසරති, අනඤ්ඤ'''න්ති.** | එකම විඤ්ඤාණය වෙනස් වෙන්නේ නැතිව ආත්මයෙන් ආත්මයට ජීවයෙන් ජීවයට ගමන් කරනවා කියලා දෘෂ්ටියක් ඇති වූ බව අනිත් ස්වාමීන්වහන්සේලාට දැන් ගන්න ලැබුණා. |
| **අථ ඛො තෙ භික්ඛූ යෙන සාති භික්ඛු කෙවට්ටපුත්තො තෙනුපසඞ්කමිංසු;** | ඒ ස්වාමීන්වහන්සේලා කේවට්ට පුත්ත සාති භික්ෂුව ළඟට යනවා. |
| **උපසඞ්කමිත්වා සාතිං භික්ඛුං කෙවට්ටපුත්තං එතදවොචුං -** | ගිහිල්ලා මෙහෙම අහනවා. |

ඒ ස්වාමීන්වහන්සේලා එක පාරටම චෝදනා කරන්නේ නෑ සාති භික්ෂුවට. ඒ භික්ෂූන් වහන්සේලා ඒ හාමුදුරුවෝ ගාවට ගිහිල්ලා මෙසේ අසනවා.

| | |
|---|---|
| **''සච්චං කිර තෙ, ආවුසො සාති, එවරූපං පාපකං දිට්ඨිගතං උප්පන්නං - 'තථාහං භගවතා ධම්මං** | ''ඇවැත්නි ඔබ වහන්සේට නොවෙනස් වූ විඤ්ඤාණයක් ආත්මයෙන් ආත්මයට යනවා, අනෙකක් නොවෙයි කියලා පාපී වූ දෘෂ්ටියක් පහළ |

| | |
|---|---|
| **දෙසිතං ආජානාමි යථා තදෙවිදං විඤ්ඤාණං සන්ධාවති සංසරති, අනඤ්ඤ'''න්ති?** | උනා කියලා දැන ගන්න ලැබෙනවා. ඒක ඇත්තද?'' කියලා අහනවා. |

ඒ වේලාවේ සාති භික්ෂුව මෙසේ ප්‍රකාශ කරනවා.

| | |
|---|---|
| **''එවං බ්‍යා ඛො අහං, ආවුසො, භගවතා ධම්මං දෙසිතං ආජානාමි යථා තදෙවිදං විඤ්ඤාණං සන්ධාවති සංසරති, අනඤ්ඤ''න්ති.** | ''බුදුරජාණන් වහන්සේ දේශනා කරලා තිබෙන ධර්මයට අනුව මම ඔය විදියටයි දන්නේ''. |

ඒ හාමුදුරුවෝ 'එහෙම නොවෙයි' කියලා කිව්වේ නෑ. බුදුරජාණන්වහන්සේගේ කාලයෙත් හිටියා සමහර හරි කටකාර අය. ඒ අයට වචන එනවා හෝ ගාල. හෝ ගාල කියන්න පුළුවන්. යම් කිසි දෙයක් අහගෙන ඉන්නකොට අපිට ඒකෙ වරදක් හොයන්න සෑහෙන කල් යනවා. නමුත් කෙනෙක් විනාඩියක් කථා කරනවා නම් වැරදි හොයන්නා වූ කෙනාට වැරදි පහක් විතර හොයා ගන්න පුළුවන්. ඒ වගේ චරිත තිබෙනවා. ඒවාගේම තමයි ඒවාට අනිත් පැත්තට විවේචනාත්මකව කියන්න පුළුවන් සමහර අය ඉන්නවා. ඒක හැටියක්. සමහර අයගේ කථා ස්වරූපය හරි රළුයි. ගොරෝසුයි. ගැලපුනත් නොගැලපුනත් එහෙම කියන අය බුදුරජාණන්වහන්සේගේ කාලයෙත් හිටියා. බුදුරජාණන්වහන්සේගේ කාලයේදී තමයි මේකත් සිද්ධ වෙන්නේ.

ඊළඟට ඒ ස්වාමීන්වහන්සේලා මෙහෙම වැඩක් කළා.

**අථ ඛො තෙ භික්ඛූ සාතිං භික්ඛුං කෙවට්ටපුත්තං එතස්මා පාපකා දිට්ඨිගතා විවෙචෙතුකාමා සමනුයුඤ්ජන්ති සමනුගාහන්ති සමනුභාසන්ති -**

සාති ස්වාමීන්වහන්සේගෙන් මේ කරුණ අහලා ඒ යහපත් ගුණවත් ස්වාමීන්වහන්සේලා ධර්මානුකූලව හිතනවා 'මේ සාති භික්ෂුවට මේක පාපී දෘෂ්ඨියක්. මේක මේ ස්වාමීන්වහන්සේට අනර්ථයක්. ඒ විතරක් නොවෙයි ඒ ස්වාමීන්වහන්සේ පසු පස යන්නා වූ විශාල පිරිසකට අනර්ථයක්' කියලා. බුදුරජාණන්වහන්සේ දේශනා නොකළ මිත්‍යා දෘෂ්ඨියක් බුදුරජාණන්වහන්සේ දේශනා කළා කියලා මේ සාති භික්ෂුව සමාජ ගත කරනවා. ඒක පාපයක්. ඒක නිසා අනිත් හාමුදුරුවරු ඒ ස්වාමීන්වහන්සේගේ දෘෂ්ඨිය වැරදියි කියලා පෙන්නලා දෙන්න, ඒ වාගේම විවේචනය කරමින් ඒ ස්වාමීන්වහන්සේට වටහා දෙන්න මේ විදියට ප්‍රකාශ කරනවා.

**''මා එවං, ආවුසො සාති, අවච** = ''ඇවැත්නි සාති ඔය විදියට කියන්න එපා.

**මා භගවන්තං අබ්භාචික්ඛි** = බුදුරජාණන් වහන්සේට බණින්නවත් බණනන්නවත් එපා.

**න හි සාධු භගවතො අබ්භක්ඛානං** = බුදුරජාණන්වහන්සේට චෝදනා කිරීම බැණ වැදීම බැණනවීම හොඳ එකක් නම් නොවෙයි' යනුවෙන්.

බණනවනවා කියලා කියන්නේ කොහොමද? දැන් ඔය කථාව අහපු තවත් අය හිටියොත් ඒ අය බුදුරජාණන්වහන්සේට බණිනවා. 'ඔය ඉන්නේ ගෞතමයන් වහන්සේගේ ශ්‍රාවකයෝ. ඔන්න ගෞතමයන් වහන්සේ ගෝලයන්ට උගන්නලා තිබෙන හැටි' කියලා බුදුරජාණන්වහන්සේටත් දොස් කියනවා. එතකොට ඒ දොස් කියන්නා වූ අය පවු කර ගන්නවා. අකුසල් වඩා ගන්නවා.

බුදුරජාණන්වහන්සේට නින්දාවක් කෙරෙන දොස් පවරන මාර්ගයක් ඒක. ඒ හරහා අනිත් අයගේත් අපාය ගමන හදා ගන්න ක්‍රමයක්.

| | |
|---|---|
| **න හි භගවා එවං වදෙය්‍ය** | කවදාකවත් බුදුරජාණන්වහන්සේ මෙහෙම නම් කියන්නේ නෑ කියලා ඒ භික්‍ෂූන් වහන්සේලා කියනවා. |
| **අනෙකපරියායෙනාවුසො සාති පටිච්චසමුප්පන්නං විඤ්ඤාණං වුත්තං භගවතා** | ඇවත් සාති නොයෙක් ආකාරයෙන් බුදුරජාණන්වහන්සේ දේශනා කරලා තිබෙන්නේ විඤ්ඤාණය පටිච්චසමුප්පන්න බවයි. ඒ කියන්නේ හේතුවකින් හටගන්නා වූ විඤ්ඤාණයක් බවයි. |
| **අඤ්ඤත්‍ර පච්චයා නත්ථි විඤ්ඤාණස්ස සම්භවො** | **(අඤ්ඤත්‍ර පච්චයා)** ප්‍රත්‍යයක් නැති කල්හි විඤ්ඤාණය හට ගැනීමක් සම්භවයක් නෑ. |
| **එවම්පි ඛො සාති භික්ඛු කෙවට්ටපුත්තො තෙහි භික්ඛූහි සමනුයුඤ්ජියමානො සමනුගාහියමානො සමනුභාසියමානො** | මේ විදියට ඒ භික්ෂූන් වහන්සේලා මේ සාති භික්ෂූන්වහන්සේට විවේචනය කරලා කරුණු පැහැදිලි කරලා කිව්වත් |
| **තදෙව පාපකං දිට්ඨිගතං ථාමසා පරාමාසා අභිනිවිස්ස වොහරති** | ඒ දෘෂ්ඨියට තදින් ඇලිලා තදින් බැඳිලා තදින් ග්‍රහණය වෙලා තිබෙන්නේ, |
| **''එවං බ්‍යා ඛො අහං, ආවුසො, භගවතා ධම්මං දෙසිතං ආජානාමි යථා තදෙවිදං විඤ්ඤාණං සන්ධාවති සංසරති අනඤ්ඤ''න්ති.** | එකම විඤ්ඤාණයක් භවයෙන් භවයට ගමන් කරනවා කියන ධර්මයක් බුදුරජාණන් වහන්සේ දේශනා කළා කියලා ඒ සාති භික්ෂුව තදින් පිළිඅරගෙන. |

සාති භික්ෂුවට ඒ දෘෂ්ඨිය තදින්ම කා වැදිලා තිබෙන්නේ. ඒ භික්‍ෂූන්වහන්සේලා එහෙම කිව්වා කියලා එයා ඒ දෘෂ්ඨිය අත හරින්නේ නෑ. යම් කිසි දෘෂ්ඨියක් වැදුනොත් ඒක අරින්න හරි අමාරුයි. හේතුව ඒ දෘෂ්ඨියත් එක්ක පුද්ගලයෙක් බිහිවෙනවා. යම්කිසි කෙනෙක් දෘෂ්ඨියක් හදා ගත්තොත්, වැරදි සංකල්පයක් හදා ගත්තොත් ඒ තුල ආචාර්ය වරයෙක් වගේ බරපතල මාන්නයෙන් පිම්බිච්ච පුද්ගලයෙක් නිර්මාණය වෙනවා. ඒ පුද්ගලයාටත් බැඳෙනවා, ඒ වාගේම ඒ දෘෂ්ඨියත් තදට බැඳෙනවා. එහෙම උනහම ඒ කෙනා ඒ දෘෂ්ඨිය අයින් කරන්නේ නෑ. අයින් කරන්නේ නැත්තේ ඒ දෘෂ්ඨියෙන් ජනප්‍රිය උනහම ඒ පාපී වූ දෘෂ්ඨියෙන් ප්‍රසිද්ධ උනහම ඒ ප්‍රසිද්ධිය නැති වෙනවා කියලා කියන්නේ ඒ මනුස්සයා කඩා වැටෙනවා කියන එක. ඒක නිසා එයා ඒ දෘෂ්ඨිය අත හරින්නේ නෑ. ඒවගේම ඒ දෘෂ්ඨිය එයාට ගැලපෙන විදියට හොඳට කරුණු කාරණා ඇතුව පදන් වෙලා තිබෙන්නේ. එයාට තහවුරු කරගන්න පුළුවන් තරමේ පදමක් හැදිලා තිබෙනවා. ඒක ටිකෙන් එහාට එයා යන්නේ නෑ. ඒ ටිකෙන් එහාට හිතන්නෙත් නැත්තේ අනිත් ඒවා හිතුවොත් එහෙම මේක දුර්වල වෙලා දෙදරලා යනවා. ඒ තමයි දෘෂ්ඨියේ හැටි. දෘෂ්ඨිය කියලා කියන්නේ ප්‍රඥාව වගේ ප්‍රඥාවේ ස්වරූපයෙන් වැඩ කරන්නා වූ පාපී වූ අදහසක්. දැන් මේ කාලේ හැටියට ඉක්මනට මේවා පැතිරෙනවා. ඒ කාලෙත් ඉතා වේගයෙන් යම් යම් දේවල් පැතිරිලා තිබෙනවා. වෙළඳාමෙනුත් ඒ

වාගේම සමහර ඒවා දෙවි දේවතාවොත් හසුරුවලා තිබෙනවා. ඔය ක්‍රමවලට මේවා පැතිරිලා තිබෙනවා. මිනිස්සුන්ට දේවල් දැන ගන්න හරිම උවමනා කමක් තිබෙනවා. මිනිස්සු හරි curious.

<u>මහත්මයෙක්</u> - ස්වාමීන්වහන්ස අර මංගල කරුණු සම්බන්ධයෙනුත් කෝලාහයක් ඇති උනා නේද?

<u>ස්වාමීන්වහන්සේ</u> - ඔව් ඒක දිව්‍යලෝකයටත් ගියා. මනුස්ස ලෝකයෙන් පටන් ගත්ත එක දිව්‍යලෝකයට ගිහිල්ලා දිව්‍ය ලෝකයෙන් තමයි ප්‍රශ්නයක් හැටියට ආවේ. දෙවි දේවතාවෝ පවා පක්ෂග්‍රාහී වෙනවා. ඒකට හේතුව ඒ ඔක්කොම කෙලෙස් නසපු අය නොවෙන නිසා. ආර්ය දෙවිවරුත් ඉන්නවා. සමහර වෙලාවට වැඩි ධර්මයක් දන්නේ නෑ. ඒ අය කාම භෝගී ජීවිත ගත කරන අය. එක වෘක්ෂ දේවතාවෙකුගේ විමානය පිහිටා තිබෙන ගහේ මුල වැලක් හැදෙනවා. ඒක නිසා ඒ දෙවියා අඬනවලු. ඇයි ඒ? හේතුව අර වැල හැදීගෙන හැදීගෙන උඩට ආවොත් ඒ ගහ මැරෙනවා. ඒ දෙවියට ක්‍රමයක් නෑ ඒ වැල අයින් කරගන්න. නමුත් අපි ඔක්කොම security බාර දෙන්නේ දෙවියන්ට. නමුත් විමානය ආරක්ෂා කරගන්න බෑ. ඉතින් ඔය වගේ ස්වභාවයක් තිබෙන්නේ. දෙවි ගොල්ලොත් පක්‍ෂග්‍රාහී වෙනවා. ඒක නිසා හරිම භයානකයි.

ප්‍රධාන වශයෙන් දෘෂ්ඨී දෙකක් තිබෙනවා. එකක් තමයි උච්ඡේදවාදය. අනිත් එක තමයි සාස්වත වාදය. සාස්වත දෘෂ්ඨීය හැදෙනවා උච්ඡේද දෘෂ්ඨීය හැදෙනවා. උච්ඡේද දෘෂ්ඨීය කියන්නේ මරණයෙන් පස්සේ ඉස්සරහට මොකක්වත් නෑ කියලා බාර ගන්න එක. කර්මයකුත් නෑ. ඵලයකුත් නෑ කියලා ඒ අය භාර ගන්නවා. සාස්වත දෘෂ්ඨීය කියලා කියන්නේ වෙනස් වෙන්නේ නැතුව දිගටම පවතිනවා කියන කාරණය පිළිගැනීම. ආත්ම දෘෂ්ඨීයත් ඒකට අයිතියි. මොකක් හරි දෙයක් බාර ගන්නවා නම් දැඩිකොට දිගට තිබෙනවා කියලා, ඒකට කියනවා සාස්වත දෘෂ්ඨීය කියලා.

නැවතත් සූත්‍ර දේශනාවට.

| | |
|---|---|
| **යතො ඛො තෙ භික්ඛූ නාසක්ඛිංසු සාතිං භික්ඛුං කෙවට්ටපුත්තං එතස්මා පාපකා දිට්ඨිගතා විවෙචෙතුං,** | මේ හාමුදුරුවරු කරුණු පැහැදිලි කළත් සාති භික්ෂුවගේ මිත්‍යා දෘෂ්ඨී නැති කරන්න බැරි උනා. |

දැන් මේ සාති භික්ෂුවට තිබුණ දෘෂ්ඨීය මොකක්ද? එකම විඤ්ඤාණය සංසාරයේ ආත්මයෙන් ආත්මයට ජීවයෙන් ජීවයට ගමන් කරනවා, වෙන මොකක් වත් නොවෙයි කියලා. ඒකට හේතුව බෝධිසත්වයන් වහන්සේ එක ජීවිතියකින් ඊළඟ ජීවිතියක උපදිනවා කියලා ජාතක දේසනා වල තිබෙනවා. සම්මුති දෙසනාවල් වල රැඳෙනකොට ඔය වැඩේ වෙනවා. ඒක නිසා බුදුරජාණන්වහන්සේ ජාතක දේසනාවක් දේසනා කරලා එතැනින් නවතින්නේ නෑ. ජාතක දේසනාවේ කෙළවර චතුරාර්ය සත්‍යය ධර්මය විස්තරයක් තිබෙනවා හේතු ඵල මිශ්‍රණයක් එක්ක. ඒ හරියට යන්නේ නෑ. කථා සාරයෙන් නවතිනවා. කථාවල තිබෙන්නේ පුද්ගලයින්, රටක්, නගරයක්, යුද්ධයක්, ස්ථානයක්, මාළිගාවක් වගේ දේවල්. ඒ කථා සාරය පමණක් වින්දනය කරනවා, හේතු ඵල ධර්ම හොයන්නේ නෑ. එතකොට සාස්වත දෘෂ්ඨීයට යන්න ඒක හේතු වෙනවා.

| | |
|---|---|
| **අථ ඛො තෙ භික්ඛූ යෙන භගවා තෙනුපසඞ්කමිංසු;** | ඒ ස්වාමීන්වහන්සේලා එතනින් අයින් වෙලා බුදුරජාණන් වහන්සේ ළඟට ගියා. |

| | |
|---|---|
| **උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු.**<br><br>**එකමන්තං නිසින්නා ඛො තෙ භික්ඛූ භගවන්තං එතදවොචුං -**<br><br>**''සාතිස්ස නාම, භන්තෙ, භික්ඛුනො කෙවට්ටපුත්තස්ස එවරූපං පාපකං දිට්ඨිගතං උප්පන්නං -**<br><br>**'තථාහං භගවතා ධම්මං දෙසිතං ආජානාමි යථා තදෙවිදං විඤ්ඤාණං සන්ධාවති සංසරති, අනඤ්ඤ'න්ති.**<br><br>**අස්සුම්හ ඛො මයං, භන්තෙ, සාතිස්ස කිර නාම භික්ඛුනො කෙවට්ටපුත්තස්ස එවරූපං පාපකං දිට්ඨිගතං උප්පන්නං - 'තථාහං භගවතා ධම්මං දෙසිතං ආජානාමි යථා තදෙවිදං විඤ්ඤාණං සන්ධාවති සංසරති, අනඤ්ඤ'න්ති.**<br><br>**අථ ඛො මයං, භන්තෙ, යෙන සාති භික්ඛු කෙවට්ටපුත්තො තෙනුපසඞ්කමිම්හ;** | එහෙම ගිහිල්ලා බුදුරජාණන්වහන්සේට වන්දනා කරලා පසෙකින් වාඩි උනා.<br><br>පැත්තකින් වාඩිවූ භික්ෂුන් වහන්සේලා බුදුරජාණන්වහන්සේට මෙසේ පවසනවා.<br><br>''ස්වාමිනී බුදුරජාණන්වහන්ස සාති කියන්නා වූ කෙවට්ටපුත්ත ස්වාමීන්වහන්සේට මේ වගේ පාපි වූ දෘෂ්ඨියක් පහළ වෙලා -<br><br>භාග්‍යවතුන් වහන්සේ මේ වගේ ධර්මයක් දේශනා කරලා තිබෙන වාලු - ඒ තමයි නොවෙනස් වූ විඤ්ඤාණයක් ආත්මයෙන් ආත්මයට සැරිසරනවා කියලා.<br><br>ස්වාමීනි අපිට අහන්න ලැබුණා උන් වහන්සේගේ ඒ පාපී දෘෂ්ඨිය ගැන.<br><br>මෙහෙම අහන්න ලැබිලා අපි ඒ පාපී භික්ෂුව ගාවට ගියා, |

ඊළඟට ඒ භික්ෂුන් වහන්සේලා බුදුරජාණන් වහන්සේට පවසනවා එහෙම ගිහිල්ලා ඒ සාති භික්ෂුවට කරුණු කාරණා පෙන්නලා උත්සාහ කළා ඒ දෘෂ්ඨිය අයින් කරන්න. බුදුරජාණන්වහන්සේ එවැනි බණක් දේශනා කරන්නේ නෑ කියලා කිව්වත් ඒක ඒ හාමුදුරුවෝ භාර ගත්තේ නැති බවත් ඒ දෘෂ්ඨිය අයින් කරන්නේ නැති බවත් සිදුවූ සියල්ල මේ විදියට බුදුරජාණන් වහන්සේට මතක් කළා. ඒ වේලාවේදී බුදුරජාණන් වහන්සේ එක්තරා භික්ෂුවක් ආමන්ත්‍රණය කරනවා = **අථ ඛො භගවා අඤ්ඤතරං භික්ඛුං ආමන්තෙසි.**

| | |
|---|---|
| **''එහි ත්වං භික්ඛු, මම වචනෙන සාතිං භික්ඛුං කෙවට්ටපුත්තං ආමන්තෙහි - 'සත්ථා තං, ආවුසො සාති, ආමන්තෙතී'''ති.**<br><br>**'එවං, භන්තෙ''ති ඛො සො භික්ඛු භගවතො පටිස්සුත්වා යෙන සාති භික්ඛු කෙවට්ටපුත්තො තෙනුපසඞ්කමි;** | ''මහණ ඔබ ගිහිල්ලා ඒ සාති භික්ෂුවට මගේ වචනයෙන් කථා කරන්න 'ශාස්තෘන් වහන්සේ ඔබට කථා කරනවා කියලා කියන්න' කියලා පණිවිඩයක් ඇරියා.<br>'හොඳමයි ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස කියලා භාග්‍යවතුන් වහන්සේගේ වචනය භාර අරගෙන සාති භික්ෂුන් වහන්සේ ගාවට ගියා. |

| | |
|---|---|
| **උපසඞ්කමිත්වා සාතිං භික්ඛුං කෙවට්ටපුත්තං එතදවොච - ‘‘සත්ථා තං, ආවුසො සාති, ආමන්තෙතී’’ති.** | ගිහිල්ලා සාති භික්ෂුවට ‘බුදුරජාණන්වහන්සේ ඔබට කථා කරනවා’ කියලා කියනවා. |
| **‘එවමාවුසො’’ති ඛො සාති භික්ඛු කෙවට්ටපුත්තො තස්ස භික්ඛුනො පටිස්සුත්වා යෙන භගවා තෙනුපසඞ්කමි; උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි.** | එසේය, ඇවැත්නි කියලා සාති භික්ෂුව භාග්‍යවතුන් වහන්සේ ගාවට වැඩලා බුදුරජාණන්වහන්සේට වන්දනා කරලා පැත්තකින් වාඩි උනා. |

දැන් මේ සාති භික්ෂුව බුදුරජාණන්වහන්සේ ළඟට වැඩියහම බුදුරජාණන්වහන්සේ එක පාරටම දොස් කිව්වේ නෑ. ආර්යන්වහන්සේලාගේ ක්‍රමයක් තිබෙනවා. ආර්යන්වහන්සේලාගේ පිළිවෙතක් තිබෙනවා. ආර්යන් වහන්සේලාගේ ඒ පිළිවෙත ආර්යන් වහන්සේලාගේ ක්‍රමය තමයි ඉස්සර වෙලාම බලනවා ඒක ඇත්තද කියලා. වැරද්ද කරන කෙනාගේම වචනයෙන්ම ඒ ගැන දැනගන්නවා. ඒක නිසා බුදුරජාණන්වහන්සේ මෙසේ ප්‍රශ්න කරනවා.

| | |
|---|---|
| **‘‘සච්චං කිර, තෙ, සාති, එවරූපං පාපකං දිට්ඨිගතං උප්පන්නං - ‘තථාහං භගවතා ධම්මං දෙසිතං ආජානාමි යථා තදෙවිදං විඤ්ඤාණං සන්ධාවති සංසරති, අනඤ්ඤ’’’න්ති?** | ‘‘සාති ඔබට මේ වගේ පාපී දෘෂ්ඨියක් පහළ උනා කියලා කියන්නේ ඇත්තද? ඒ දෘෂ්ඨිය තමයි නොවෙනස් වූ විඤ්ඤාණයක් ආත්මයෙන් ආත්මයට සැරිසරනවා, වෙන එකක් නොවෙයි’’ කියලා. |

එහෙම ඇහුවහම ඒ සාති හාමුදුරුවෝ බුදුරජාණන් වහන්සේ ඉස්සරහ පිටම බුදුරජාණන්වහන්සේගේ පා මුල වැඳ වැටිලා කියනවා එසේ නොවෙනස්ව හවයෙන් හවයට සැරිසරන විඤ්ඤාණයක් තිබෙනවා කියලා බුදුරජාණන්වහන්සේ දේශනා කරන බව ඔහු දන්නා බව.

| | |
|---|---|
| **‘‘එවං ඛ්‍යා ඛො අහං, භන්තෙ, භගවතා ධම්මං දෙසිතං ආජානාමි යථා තදෙවිදං විඤ්ඤාණං සන්ධාවති සංසරති, අනඤ්ඤ’’න්ති.** | ‘ස්වාමීනි එසේය, ‘මේ එකම විඤ්ඤාණයක් හවයෙන් හවයට ගමන් කරන බවත් භාග්‍යවතුන් වහන්සේ විසින් එසේ ධර්මය දේශනා කරනලද බව මම දනිමි’. |

එවිට බුදුරජාණන්වහන්සේ සාති භික්ෂුවගෙන් මෙසේ ප්‍රශ්න කරනවා.

| | |
|---|---|
| **‘‘කතමං තං, සාති, විඤ්ඤාණ’’න්ති?** | ‘‘සාති, ඒ වෙනස් නොවී හවයෙන් හවයට ගමන් කරන විඤ්ඤාණය කුමක්ද? කියලා. |
| **‘‘ය්වායං, භන්තෙ, වදො වෙදෙය්‍යො තත්‍ර තත්‍ර කල්‍යාණපාපකානං කම්මානං විපාකං පටිසංවෙදෙතී’’ති.** | ‘ස්වාමීනි යම් කිසි තැනක හොඳ හෝ වේවා නරක හෝ වේවා කර්මයක විපාක විඳිනවා නම් ඒ ඒ විදියට කියවෙන්නා වූ විඤ්ඤාණයක් ගමන් |

| | |
|---|---|
| | කරනවා කියන කථාව තමයි මම මේ කියන්නේ' කියලා ඒ භික්ෂූන් වහන්සේ ප්‍රකාශ කළා. |

මේ සාති භික්ෂුවට තිබෙන දෘෂ්ටිය තමයි යම් කිසි කෙනෙක් යම් කිසි අවස්ථාවකදී පිනක් කරලා ඒ පිනෙහි විපාකය විදින අවස්ථාවේදී ඒ විඳින්නෙත් ඒ පින කරපු හිතම තමයි කියන එක. එවිට බුදුරජාණන්වහන්සේ නැවතත් සාති භික්ෂුවගෙන් මෙසේ ප්‍රශ්න කරනවා.

| | |
|---|---|
| **"කස්ස නු ඛො නාම ත්වං, මොඝපුරිස, මයා එවං ධම්මං දෙසිතං ආජානාසි?** | "හිස් පුරුෂය මා විසින් කාට මේ වගේ බණක් දේශනා කරන ලද බව ඔබ දන්නේ? |
| **නනු මයා, මොඝපුරිස, අනෙකපරියායෙන පටිච්චසමුප්පන්නං විඤ්ඤාණං වුත්තං, අඤ්ඤත්‍ර පච්චයා නත්ථි විඤ්ඤාණස්ස සම්භවොති?** | මම නොයෙක් ආකාරයෙන් කියලා දුන්නේ මේ විඤ්ඤාණය පටිච්චසමුප්පන්නයි, (**අඤ්ඤත්‍ර පච්චයා**) ප්‍රත්‍යය නැතුව විඤ්ඤාණයක් හට ගන්නේ නැති බව නොවේද? |
| **අථ ච පන ත්වං, මොඝපුරිස, අත්තනා දුග්ගහිතෙන අම්හෙ චෙව අබ්භාචික්ඛසි, අත්තානඤ්ච ඛණසි, බහුඤ්ච අපුඤ්ඤං පසවසි. තඤ්හි තෙ, මොඝපුරිස, භවිස්සති දීඝරත්තං අහිතාය දුක්ඛායා"ති.** | ඒ උනත් හිස් පුරුෂය තමා විසින් වරදවා ගත් මේ දැනීමෙන් අපිටත් දොස් පවරනවා. තමාගේ ජීවිතියේ අකුසලය භාර ගන්නවා, බොහෝ පවු කරගන්නවා. හිස් පුරුෂය මේ දෘෂ්ටිය ඔබට දීර්ඝ කාලයක් අහිත පිණිස දුක් පිණිස අවැඩ පිණිස අනර්ථය පිණිස ඒකාන්තයෙන්ම පවතිනවා" කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. |

දැන් බලන්න මේ බුදුරජාණන්වහන්සේගේ ප්‍රකාශනය. තථාගත බුදුරජාණන්වහන්සේ ජීවමාන වැඩ ඉන්න කාලයේදීම තමයි මේ සිද්ධිය සිදු වෙන්නේ. මේ සිද්ධිය සිදු වෙන්නේ සැවැත්නුවර ජේතවනාරාමයේ. එතැනදී තමයි මේක නිරවුල් කරන්නේ.

දැන් හොඳට බලන්න. මේ සිද්ධිය සාමාන්‍ය පොඩි සිද්ධියක් නොවෙයි. අනිත් භික්ෂූන් වහන්සේලාටත් මේ කථාව දැන ගන්න ලැබෙන හේතුව සාති හාමුදුරුවෝ මේ දෘෂ්ටිය හැම තැනම පතුරුවලා තිබෙනවා. ඒ විදියට ප්‍රසිද්ධ වූ එකක් තමයි ඒ භික්ෂූන් වහන්සේලාට දැන ගන්න ලැබුණේ. උන්වහන්සේලාත් ගිහිල්ලා මේක විසඳන්න බැලුවා. පුළුවන් උනාද? නෑ. ඒකට හේතුව, ඔය හාමුදුරුවෝ කට කාර උනාට පස්සේ පරදින්න කැමති නෑ. බුදුරජාණන්වහන්සේ ඒ කාලයේ වැඩ හිටපු නිසා තමයි උන්වහන්සේගේ ගාවට මේ හාමුදුරුවෝ ගෙනියන්න පුළුවන් කම තිබෙන්නේ. දැන් මොහු බුදුරජාණන්වහන්සේගේ ධර්මය බාර ගත්තද? බාර ගත්තේ නෑ.

බුදුරජාණන් වහන්සේ ජීවමාන වැඩ ඉන්න කාලයේත් උන්වහන්සේගේ සජීවී මිහිරි වූ වචනයෙන් බුදුරජාණන් වහන්සේගේ ඒ මිහිරි වූ කට හඬින්ම කියපු දේ පිළිගත්තේ නැත්නම් උන්වහන්සේගේ ශ්‍රාවකයෝ මෙච්චර කාලයක් රැකගෙන ආවා වූ මේ ත්‍රිපිටක ධර්මය අපි ශාස්තෘ ගෞරවයෙන් ඉදිරිපත් කළාට ශ්‍රද්ධාව තිබෙන අය හැර දෘෂ්ටි තිබෙන අය පිළිගන්නේ නෑ. තථාගතයන් වහන්සේ කෙරෙහි ධර්මය කෙරෙහි මේ ධර්මය රැකපු ආරක්ෂා කරපු රහතන්වහන්සේලා කෙරෙහි ස්වාමීන්වහන්සේලා කෙරෙහි ශ්‍රද්ධාව ගෞරවය නිහතමානිත්වය තිබෙන අය පිළිගන්නවා හැර වෙන

කවුරුත් ඕවා පිළිගන්නේ නෑ. ගොරෝසු කර්කස කටුක අදහස් තිබෙන හිත් තිබෙන අය ඕවා බාර ගන්නේ නෑ. හේතුව තමන් කඩා වැටෙන නිසා. ඉතින් ඒ අයට කරන්න තිබෙන්නේ ඔය අච්චු ගහපු අයටයි පොත් ලියපු අයටයි පරිවර්තනය කරපු අයටයි බැණ බැණ ඉන්න එක තමයි. එතකොට වෙන්නේ **අත්තානඤ්ච ඛණති** = තමන්ගේ ජීවිතයේ පවු වල තමන්ම හාර ගන්නවා. **බහුඤ්ච අපුඤ්ඤං පසවති** = බොහෝ පවු රැස් කරගන්නවා. 'කරන කලට පවු මිහිරිය මී සේ' කියලයි කියන්නේ. පවු කරන වෙලාවට ඕක තේරෙන්නේ නෑ.

කාශ්‍යප බුදුරජාණන්වහන්සේගේ කාලයේත් හිටියා කියන දේ ඇහුවේ නැති හාමුදුරුවෝ කෙනෙක්. සෝධන රහතන්වහන්සේගේ මල්ලි, කපිල තෙරුන්වහන්සේ කාශ්‍යප බුදුරජාණන්වහන්සේගේ සාසනය නැතිවෙන්න හේතු කාරණා හැදුවා. කියන දේ පිළිගත්තේ නෑ. තමන්ගේ වචනය ඉස්මතු කළා.

දැන් මේ සාති භික්ෂුවත් බුදුරජාණන්වහන්සේ කියපු දේ පිළිගත්තේ නෑ. ඒවගේ කෙනෙකුට බණ කීමෙන් වැඩක් වෙන්නේ නෑ, එයාගේ දෘෂ්ඨි අත හරින තාක් කල්. ඒ දෘෂ්ඨිය අත හැරලා දාලා හිත සුද්ද කරලා ඒක සනීප වෙනකම් ඒ හිතට වෙන එකක් දාන්න බෑ. අපි හිතමු ශරීරයට ලීයක් හෝ ඇනයක් හෝ කට්ටක් වැදුනහම ඒක බාහිරෙන් ශරීරයට ආවට පස්සේ ඒකෙ මලකඩත් තිබෙනවා, කුණුත් තිබෙනවා, විසබීජත් තිබෙනවා. ඒවගේ දෙයක් ශරීරයට වැදුනට පස්සේ ඕක ගලවලා දැම්ම ගමන් සනීප වෙනවද? නෑ. ඒක ගලවලා දාල ඒ ඇනිච්ච තැන තවත් මලකඩ තැවරිලා තිබෙනවා නම් ඒවත් අයින් කරලා, ඒවාගේම එතැනින් විහිදිලා තිබෙන්නා වූ ඇතුලට කා වැදී තිබෙන්නා වූ යම් කිසි විස බීජයක් තිබෙනවා නම් ඒවත් අයින් කරලා ඒ තුවාලෙත් සනීප වෙලා ඒ සියල්ල ශරීරයෙන් අයින් වෙලා බැහැර වෙලා සම්පූර්ණ වෙනකම් එයා නිරෝගී කෙනෙක් වෙන්නේ නෑ. දෘෂ්ඨියක් වැදුනහමත් එහෙමයි. එයා ඒ දෘෂ්ඨිය අයින් කරලා ඒකෙන් ඉවත් වෙලා ඒක හොඳට යථා තත්වයට පත්වෙනකල්ම කවදාකවත්ම එයාගේ හිතට සම්පූර්ණ සනීපයක් නෑ. ඒක නිසා එවැනි කෙනෙකුට බණ දේශනා කරන්න ගියාට වැඩක් වෙන්නේ නෑ.

ඒක නිසා මේ සාති භික්ෂුවටත් බුදුරජාණන්වහන්සේ ධර්ම දේශනා කරන්නෙ නැතුව ඒ ස්වාමීන්වහන්සේ මුල් කරගෙන අසන්නා වූ පිරිසිදු සිත් තිබෙන අනිත් භික්ෂූන් වහන්සේලාට ධර්මය දේශනා කළා.

| | |
|---|---|
| **අථ ඛො භගවා භික්ඛූ ආමන්තෙසි -** | භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් ආමන්ත්‍රණය කරනවා. |
| **''තං කිං මඤ්ඤථ, භික්ඛවෙ, අපි නායං සාති භික්ඛු කෙවට්ටපුත්තො උස්මීකතොපි ඉමස්මිං ධම්මවිනයෙ''ති?** | ''මහණෙනි ඔබලා කුමක්ද සිතන්නේ? මේ සාති කියන භික්ෂුවට මේ සාසනයේ ධර්ම විනය පිළිබඳව පොඩි උණුසුමක්වත් ලැබිලා තිබෙනවද? හේතු ඵල ධර්මය පිළිබඳව පොඩි උණුසුමක්වත් ලැබිලා තිබෙනවද''? |
| **''කිඤ්හි සියා භන්තෙ? නො හෙතං, භන්තෙ''**ති. | ''ස්වාමීනි බුදුරජාණන්වහන්ස කොහොමද ඒක වෙන්නේ? එසේ නොවේ''. |
| **එවං වුත්තෙ,** | එලෙස කිවූ කල |

| | |
|---|---|
| **සාති භික්ඛු කෙවට්ටපුත්තො තුණ්හීභූතො මඞ්කුභූතො පත්තක්ඛන්ධො අධොමුඛො පජ්ඣායන්තො අප්පටිභානො නිසීදි.** | සාති භික්ෂුව කථා නැතිව මැලි වෙලා ශරීරය පහතට නමාගෙන මුහුණ බිමට හරවාගෙන නිශ්ශබ්දව කිසිවක් කියා ගත නොහැකිව සිටියා. |
| **අථ ඛො භගවා සාතිං භික්ඛුං කෙවට්ටපුත්තං තුණ්හීභූතං මඞ්කුභූතං පත්තක්ඛන්ධං අධොමුඛං පජ්ඣායන්තං අප්පටිභානං විදිත්වා සාතිං භික්ඛුං කෙවට්ටපුත්තං එතදවොච -** | බුදුරජාණන්වහන්සේ සාති භික්ෂුව කථා නැතිව මැලි වෙලා ශරීරය පහතට නමාගෙන මුහුණ බිමට හරවාගෙන නිශ්ශබ්දව සිටින පරාජිත ස්වභාවය දැකලා සාති භික්ෂුවට මේ අයුරින් ප්‍රකාශ කළා. |
| **''පඤ්ඤායිස්සසි ඛො ත්වං, මොඝපුරිස, එතෙන සකෙන පාපකෙන දිට්ඨිගතෙන. ඉධාහං භික්ඛූ පටිපුච්ඡිස්සාමී''ති.** | ''හිස් පුරුෂය ඔබ මේ ස්වකීය පාපී වූ දෘෂ්ටියෙන්ම ප්‍රසිද්ධ වෙනවා. ඔබ සමාජයේ ඉස්මතුවෙලා පෙනෙන්නේ ප්‍රසිද්ධ වෙන්නේ තමන්ම ගේ ස්වකීය වූ පාපී වූ දෘෂ්ටියෙන්''. |

ඒක හරියටම හරි. අදත් සාති හාමුදුරුවෝ ප්‍රසිද්ධයි. මජ්ඣිමනිකායේ මහාතණ්හාසංඛය සූත්‍රයේ ඒ හාමුදුරුවන්ගේ නම තිබෙනවා. කුමක් නිසාද? ඒ පාපී දෘෂ්ටිය නිසා. සමහරු ප්‍රසිද්ධියට කැමතියි. ප්‍රසිද්ධියට කැමති නිසා සමහරු එක එක දේවල් කරනවා. ඔතැන තිබෙන්නේ ආත්ම දෘෂ්ටිය. ආත්ම තණ්හාව, ප්‍රසිද්ධ වීමේ හැඟීම, මාන්නය, කොඩියක් දමා ගැනීමේ ආසාව ඇතිවෙන්නේ ඔය ආත්ම දෘෂ්ටිය ආවට පස්සේ. එහෙම උනහම නිහතමානී ගතිය අයින් වෙනවා. එතකොට වෙන්නේ තමන් ප්‍රසිද්ධ වෙලා තිබෙන්නේ යම් කිසි දෘෂ්ටියකින් නම් ඒක අයින් කරපු ගමන් එයා අප්‍රසිද්ධ වෙනවා. ඒකට එයා කැමති නෑ. ඒක නිසා එයා තදට ඒක තියාගෙන ඉන්නවා. දෘෂ්ටි හරිම භයානකයි. දෘෂ්ටිය නැතිවෙන්න නම් සෝවාන් වෙන්න ඕනෑ. ඇත්තටම දෘෂ්ටිය අතහැරෙන්නේ එතකොටයි. අද කාලේ සෝවාන් කියලා කියන අය සෝවාන් වෙලත් දෘෂ්ටි තිබෙනවා කියලා කියනවා. ඒක ආර්ය සෝවාන් භාවයක් නොවෙයි. ඒක හිතා ගත්තු එකක්.

| | |
|---|---|
| **අථ ඛො භගවා භික්ඛූ ආමන්තෙසි -** | භාග්‍යවත් බුදුරජාණන්වහන්සේ භික්ෂූන්ට ආමන්ත්‍රණය කරනවා. |
| **''තුම්හෙපි මෙ, භික්ඛවෙ, එවං ධම්මං දෙසිතං ආජානාථ යථායං සාති භික්ඛු කෙවට්ටපුත්තො අත්තනා දුග්ගහිතෙන අම්හෙ චෙව අබ්භාචික්ඛති, අත්තානඤ්ච ඛණති, බහුඤ්ච අපුඤ්ඤං පසවතී''ති?** | ''මහණෙනි ඔබලාවත් දන්නවද මේ සාති හාමුදුරුවෝ කියන හැටියට බණක් මම කාට හරි දේශනා කළා කියලා. මේ භික්ෂූන් වහන්සේ අපිටත් දොස් කියවන, තමන්ගේ ජීවිතියේ පාපය හාරවා ගන්න බොහෝ පාපයන් එක්කාසු කරගන්න දෙයක් මේ කියන්නේ''? |
| **''නො හෙතං, භන්තෙ! අනෙකපරියායෙන හි නො, භන්තෙ, පටිච්චසමුප්පන්නං විඤ්ඤාණං වුත්තං භගවතා, අඤ්ඤත්‍ර පච්චයා නත්ථි විඤ්ඤාණස්ස සම්භවො''ති.** | ''ස්වාමීනි, අපි එහෙම දෙයක් අහලා නෑ, ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස ඔබවහන්සේ දේශනා කරලා තිබෙන ධර්මය නොයෙක් ආකාරයෙන් විඤ්ඤාණය කියන එක පටිච්චසමුප්පන්න එකක්'' කියලා භික්ෂූන් වහන්සේලා පිළිතුරු දෙනවා. |

| | |
|---|---|
| **''සාධු සාධු, භික්ඛවෙ! සාධු ඛො මෙ තුම්හෙ, භික්ඛවෙ, එවං ධම්මං දෙසිතං ආජානාථ.**<br><br>**අනෙකපරියායෙන හි වො, භික්ඛවෙ, පටිච්චසමුප්පන්නං විඤ්ඤාණං වුත්තං මයා, අඤ්ඤත්‍ර පච්චයා නත්ථි විඤ්ඤාණස්ස සම්භවොති.** | ''සාධු සාධු මහණෙනි, ඒ වගේ ධර්මයක් නුඹලා දැනගෙන සිටිනවා නම් හොඳයි, ඒක යහපත්.<br><br>මම නොයෙක් ආකාරයෙන් දේශනා කළේ විඤ්ඤාණය පටිච්චසමුප්පන්න බවයි''. |

මේ විදියට බුදුරජාණන්වහන්සේ ඒ භික්ෂූන්වහන්සේලාගේ කථාව අනුමත කළා. හොඳට තේරුම් ගන්න, මේ තමයි සාස්වත දෘෂ්ඨියට පත් වෙච්ච හැටි. සියලුම දේවල් වෙනස් වෙනවා. රූප වෙනස් වෙනවා. වේදනා සංඥා සංඛාර වෙනස් වෙනවා. සාති භික්ෂුව බාර ගත්තේ විඤ්ඤාණය වෙනස් වෙන්නේ නෑ කියලා. එක තැනකින් වරද්ද ගත්තා. මේ සියල්ල වෙනස් වෙනවා කියන එක සම්පූර්ණයෙන්ම තේරුම් ගත්තා නම් (නිර්වාණය හැර) එතකොට තමයි නිවන කියන එකට පත්වෙන්නේ. බලන්න, මේ තමයි සසර රුඳෙන්න යන මාර්ග. මේ අපි කිව්වේ සාති හාමුදුරුවන්ගේ දෘෂ්ඨිය ගැනයි. මේ පින්වතුන් දෘෂ්ඨිගත වෙන්නේ නැතුව මේ දෘෂ්ඨිය මතක තබා ගන්න.

ඊළඟට බුදුරජාණන්වහන්සේ භික්ෂූන්වහන්සේලාට ධර්මය දේශනා කරනවා. ඇයි බුදුරජාණන්වහන්සේ භික්ෂූන්වහන්සේලාට ධර්මය දේශනා කරන්නේ? හේතුව, ඒ භික්ෂූන්වහන්සේලාගේ තිබෙනවා තථාගතයන් වහන්සේ කියන දේ පිළිගන්න හරි කීකරු ස්වභාවයක්.

මේ සූත්‍රය හරි දිගයි. නමුත් අපි එක්තරා ප්‍රදේශයක් එක්තරා ප්‍රමාණයක් කියාගෙන යනවා.

| | |
|---|---|
| **''යං යදෙව, භික්ඛවෙ, පච්චයං පටිච්ච උප්පජ්ජති විඤ්ඤාණං, තෙන තෙනෙව විඤ්ඤාණංත්වෙව සඞ්ඛං ගච්ඡති.** | ''මහණෙනි, යම් කිසි ප්‍රත්‍යයක් නිසා හේතු කොටසක් නිසා යම් කිසි විඤ්ඤාණයක් පහළ වෙනවද හටගන්නවද ඇතිවෙනවද ඒ හේතුවෙන් තමයි ඒ විඤ්ඤාණය නම් කරන්නේ. |

මේකට උදාහරණයක් කියනවා නම් කොස් ගහේ ගෙඩියක් හැදෙනවා. එතකොට ඒ ගෙඩියට කියන්නේ කොස් ගෙඩිය කියලා. පොල් ගහේ ගෙඩියක් හැදෙනවා. ඒකට කියනවා පොල් ගෙඩිය කියලා. කොස් ගෙඩිය නම් කරන්නේ කොස් ගහ ඇඳවලා. පොල් ගෙඩිය නම් කරන්නේ පොල් ගහ ඇඳවලා. ඒ ගෙඩිය හට ගන්න ප්‍රත්‍යය වූ දේට අයිති නම එකතු කරනවා. නමුත් කළුපොල් මාලුව කියන තැනදී නම් ප්‍රධාන වශයෙන් උයන්නේ කොස් ඇට. එතනදී නම් උයන දේ ඒකෙ නමට කිසිම සම්බන්ධයක් නෑ. කලාතුරකින් මේ වගේ දේවල් තිබෙනවා, නමුත් බොහෝ වෙලාවට හේතුවෙන් තමයි නම් කරන්නේ. නමුත් බුදුරජාණන් වහන්සේ දේශනා කරන කථාව මේකට සම්බන්ධ නෑ. බුදුරජාණන්වහන්සේ දේශනා කරන්නේ මෙහෙමයි.

යම් කිසි හේතුවකින් හටගන්නා විඤ්ඤාණයක් ගැන ප්‍රකාශ කරනවා නම් ඒ විඤ්ඤාණයත් ඒ හේතුවේ නමින් තමයි කියන්නේ.

| | |
|---|---|
| **චක්ඛුඤ්ච පටිච්ච රූපෙ ච උප්පජ්ජති විඤ්ඤාණං, චක්ඛුවිඤ්ඤාණංත්වෙව සඞ්ඛ්‍යං ගච්ඡති;** | ඇස නිසාත් රූපය නිසාත් ඒ දෙකේ ආධාරයෙන් විඤ්ඤාණය පහළ වෙනවා. ඒක චක්ඛු විඤ්ඤාණය කියලා ප්‍රසිද්ධියට පත්වෙනවා. |
| **සොතඤ්ච පටිච්ච සද්දෙ ච උප්පජ්ජති විඤ්ඤාණං, සොතවිඤ්ඤාණංත්වෙව සඞ්ඛ්‍යං ගච්ඡති;** | කනත් ශබ්දයත් හේතු කරගෙන විඤ්ඤාණයක් උපදිනවා. ඒකට කියනවා සෝත විඤ්ඤාණය කියලා. |
| **ඝානඤ්ච පටිච්ච ගන්ධෙ ච උප්පජ්ජති විඤ්ඤාණං, ඝානවිඤ්ඤාණංත්වෙව සඞ්ඛ්‍යං ගච්ඡති;** | නාසයයි ගන්ධයයි නිසා විඤ්ඤාණයක් පහළ වෙනවා. ඒකට කියනවා ඝාණ විඤ්ඤාණය කියලා. |
| **ජිව්හඤ්ච පටිච්ච රසෙ ච උප්පජ්ජති විඤ්ඤාණං, ජිව්හාවිඤ්ඤාණංත්වෙව සඞ්ඛ්‍යං ගච්ඡති;** | දිවත් රසයත් නිසා විඤ්ඤාණයක් පහළ වෙනවා. ඒකට කියනවා ජිව්හා විඤ්ඤාණය කියලා. |
| **කායඤ්ච පටිච්ච ඵොට්ඨබ්බෙ ච උප්පජ්ජති විඤ්ඤාණං, කායවිඤ්ඤාණංත්වෙව සඞ්ඛ්‍යං ගච්ඡති;** | කය නිසාත් පොට්ඨබ්බය නිසාත් විඤ්ඤාණයක් පහළ වෙනවා. ඒකට කියනවා කාය විඤ්ඤාණය කියලා. |
| **මනඤ්ච පටිච්ච ධම්මෙ ච උප්පජ්ජති විඤ්ඤාණං, මනොවිඤ්ඤාණංත්වෙව සඞ්ඛ්‍යං ගච්ඡති.** | මනස නිසාත් ධර්ම ස්වභාවයන් නිසාත් පහළ වෙනවා විඤ්ඤාණයක්. ඒක මනෝ විඤ්ඤාණය කියන සංඛ්‍යාවට යනවා. |

දැන් බලන්න, මෙතැන තිබෙන්නේ හේතුවකින් හටගත්ත දේ. සාති භික්ෂුව කිව්වේ එකම විඤ්ඤාණය තමයි භවයෙන් භවයට සැරිසරන්නේ කියලා. අපි පටිච්චසමුප්පාද කථාවට යන්නේ නැතුව සාති භික්ෂුව හිතපු විදියට හිතුවොත්, දැන් මම රූපයක් බලනවා. ඒ රූපය බලන්නේ මොන විඤ්ඤාණයෙන්ද? චක්ඛු විඤ්ඤාණයෙන්. දැන් අපිට වෙනත් සද්දයක් ඇහෙනවා. එතකොට මේ විඤ්ඤාණය එතැනට යනවා. සාති භික්ෂුව කියන විදියට අහන්න වෙන්නෙත් බලන්න වෙන්නෙත් ගඳ සුවඳ විඳින්න වෙන්නෙත් ඔක්කොම කරන්නේ එකම විඤ්ඤාණයෙන්. ඒ විඤ්ඤාණයම තමයි විපාක විඳින්නෙත්, භවයෙන් භවයට යන්නෙත් එකම විඤ්ඤාණයමයි. දැන් අපි රූප වාහිනියක් දිහා බලාගෙන ඉන්න ගමන් අහනවා. අහගෙන ඉන්න ගමන්ම කනවා. එතකොට කන්නෙත් අහන්නෙත් බලන්නෙත් ඔක්කොම කරන්නේ එකම විඤ්ඤාණය කියලා හිතෙන්න පුළුවන්. ඒ කුමක් නිසාද? ධර්මය දන්නේ නැති ගතිය නිසයි. පටිච්චසමුප්පාද ධර්මය සපර්ෂ වෙච්ච නැති නිසයි.

ධර්මය නොදන්නා කම භයානකයි කියලා කියන්නේ, අපි අනිත්‍යයයි දුකයි අනාත්මයි කියලා දැක්කොත් නේද නිවන් දකින්නේ? එක බණක තිබෙනවා මෙන්න මෙහෙම. එක ධර්ම දේශනාවක් මට check කරන්න කියලා එවලා තිබුණා. ලෝකයේ හාමුදුරුවරු ඉන්නවා බණ දේශනා කරන. මම විතරක් නොවෙයි. හොඳ සත්පුරුෂ හාමුදුරුවරුන්ගේ බණ අහන්න. ඒ ස්වාමීන්වහන්සේලාගේ බණ හරි හොඳයි. නමුත් අසත්පුරුෂ අයගේ බණ නම් කන මායිමට ගන්න එපා. හරි විනාසයක්.

විනාසයි කියලා කියන්නේ ඒ අහන වෙලාවත් අපරාදයක්. මම මේක ඇහුවේ බණ අහන්න ඕනේ නිසා නොවෙයි. එක්කෙනක් check කරලා එවන්න කියලා තිබුණ නිසා.

ඒ එක දේශනාවක තිබෙනවා මෙහෙම. සංස්කාරයන්ගේ තිබෙන්නා වූ අනිත්‍ය දුක්ඛ අනාත්ම ස්වභාවය දකින්නේ ඵල සිතෙන් කියලා. හොඳට බලන්න, සංස්කාරයන්ගේ තිබෙන්නා වූ සූක්ෂම වූ අනිත්‍යය වූ දුක්ඛ වූ අනාත්ම වූ ස්වභාවයන් දකින්නේ, වේදනාවේ අනිත්‍ය දුක්ඛ අනාත්මය හොඳට දකින්නේ උපේක්ෂා සහගතව ගියා වූ ඵල සිතෙන් කියලා. තවත් දේවල් මිශ්‍ර කරලා තිබුණා නමුත් මම මේ කියන්නේ මේ පින්වතුන්ට ප්‍රමාණවත් කොටස පමණයි. ඒක වැරදියි. ඵල සිතට අරමුණු වෙන්නේ නිවන පමණයි. මාර්ග සිත කියන්නේ නිවන් දකින හිතක්. ඵල සිත කියන්නේ නිවන් අරමුණු කරන සිත. ඉස්සෙල්ලාම නිර්වාණ ධාතුව හප්පා ගන්න ඇතුල් වෙන තැන තමයි ‘මාර්ග සිත’. ඒ ඇතුල් වෙච්ච තැන තිබෙන්නා වූ ශාන්ත ගතිය සුන්දර ගතිය විඳින්නා වූ සිතට කියන්නේ ‘ඵල සිත’ කියලා. මාර්ග සිතෙනුත් ඵල සිතෙනුත් දෙකෙන්ම අරමුණු කරන්නේ නිර්වාණ ධාතුවයි, අසංඛත ධාතුවයි, කිසිම හේතු ඵල ධර්මයක් නැති එකම ශාන්ත වූ සුන්දර වූ නිර්වාණ ධාතුවයි.

අනිත්‍ය දුක්ඛ අනාත්ම තිබෙන්නේ සංස්කාර ධර්ම අස්සේ. හේතු ඵල ධර්මයන් අස්සේ. නිර්වාණ ධාතුව දකින ‘මාර්ග සිත’ හේතු ඵල ධර්ම දකින්නේ **නෑ**. ‘ඵල සිත’ හේතු ඵල ධර්ම දකින්නේ **නෑ.** මාර්ග සිතෙනුත් ඵල සිතෙනුත් දකින්නේ හේතු ඵල නැති, අනිත්‍ය දුක්ඛ අනාත්ම නැති, එකම එක ශාන්ත වූ අසංඛත ධාතු ධර්මයක් පමණයි දකින්නේ. නමුත් අර වගේ බණක් ප්‍රසිද්ධ කෙනෙක් කියලා තිබුණා.

ඒක නිසා තමයි කියන්නේ හොඳට ධර්මය තේරුම් ගන්න. බුදුරජාණන්වහන්සේ දේශනා කළේ අනිත්‍ය දුක්ඛ අනාත්ම තිබෙන්නේ සංස්කාර ධර්මයන්ගේ. හේතුවෙන් හට ගත්ත දේක තමයි අනිත්‍යය තිබෙන්නේ. හේතුවෙන් හටගත්ත දේක තමයි අනාත්මය තිබෙන්නේ. නිර්වාණ ධර්මය හේතුවෙන් හටගත්ත එකක්ද? නෑ, **ඒක අසංඛතයි**. ඒකෙ දුක්ඛයක් තිබෙනවද? **නෑ**. ආත්ම ස්වභාවයක් තිබෙනවද? **නෑ.** ඒක නිසා ‘මාර්ග සිත් වලට’ ‘ඵල සිත් වලට’ අනිත්‍ය දුක්ඛ අනාත්ම උපේක්ෂාවට දැනෙන්නෙත් නෑ, සතුටට දැනෙන්නෙත් නෑ, දුකට දැනෙන්නෙත් නෑ, කොයි විදියකටවත් දැනෙන්නේ නෑ. ඊට මෙහා පැත්තේ තිබෙන සිත් වලට නම් පේන්න පුළුවන්, ඒවා නිවන් අරමුණු කරන සිත් නොවෙන නිසා.

ඊළඟට මේ විඤ්ඤාණය පහළ වෙච්ච හැටි බුදුරජාණන්වහන්සේ දේශනා කරනවා. ඒ තමයි විඤ්ඤාණය හේතුවක් නිසා හටගන්නවා. ඒ හේතුවේ නම ගන්නවා. සාති භික්ෂුවගේ දෘෂ්ඨිය තමයි අර එකම එකම විඤ්ඤාණයක් සැරිසරනවා කියන එක. බුදුහාමුදුරුවෝ දේශනා කරන්නේ විඤ්ඤාණය පටිච්චසමුප්පන්නයි කියලා. කවදාකවත් චක්ඛු විඤ්ඤාණය සෝත විඤ්ඤාණයක් වෙන්නේ නෑ.

ඊට පස්සේ බුදුරජාණන්වහන්සේ හරි ලස්සන උපමා ටිකක් දේශනා කරනවා.

| | |
|---|---|
| **‘‘සෙය්‍යථාපි, භික්ඛවෙ, යං යදෙව පච්චයං පටිච්ච අග්ගි ජලති තෙන තෙනෙව සඞ්ඛ්‍යං ගච්ඡති.**<br><br>**කට්ඨඤ්ච පටිච්ච අග්ගි ජලති, කට්ඨග්ගිත්වෙව සඞ්ඛ්‍යං ගච්ඡති;** | ‘‘මහණෙනි යම් කිසි ප්‍රත්‍යයක් නිසා ගින්දර දැල්වේද, ඒ ඒ හේතුවේ නමින් තමයි ඒ ගින්දර සැලකීමට යන්නේ.<br>එකතු කරගත්ත දර ආදිය නිසා ගින්දරක් පත්තු කරනවා. ඒකට කියනවා දර ගින්න කියලා. |

| | |
|---|---|
| **සකලිකඤ්ච පටිච්ච අග්ගි ජලති, සකලිකග්ගිත්වෙව සඞ්ඛ්‍යං ගච්ඡති;** | එකතු කරගත්තා වූ පොතු නිසා හට ගන්නා වූ ගින්දර වලට කියනවා පොතුනිසා හටගත් ගින්දර කියලා. |
| **තිණඤ්ච පටිච්ච අග්ගි ජලති, තිණග්ගිත්වෙව සඞ්ඛ්‍යං ගච්ඡති;** | තණකොළ නිසා හටගත් ගින්නට කියනවා තෘණ ගින්න කියලා. |
| **ගොමයඤ්ච පටිච්ච අග්ගි ජලති, ගොමයග්ගිත්වෙව සඞ්ඛ්‍යං ගච්ඡති;** | ගොම නිසා හටගන්නා ගින්නට කියනවා ගොම ගින්න කියලා. |
| **ථුසඤ්ච පටිච්ච අග්ගි ජලති, ථුසග්ගිත්වෙව සඞ්ඛ්‍යං ගච්ඡති;** | දහයියා නිසා ඇතිවෙන ගින්නට කියනවා දහයියා ගින්න කියලා. |
| **සඞ්කාරඤ්ච පටිච්ච අග්ගි ජලති, සඞ්කාරග්ගිත්වෙව සඞ්ඛ්‍යං ගච්ඡති.** | කුණු රොඩු නිසා ඇතිවෙන ගින්නට කියනවා කුණු රොඩු නිසා හටගත් ගින්න කියලා. |
| **එවමෙව ඛො, භික්ඛවෙ, යං යදෙව පච්චයං පටිච්ච උප්පජ්ජති විඤ්ඤාණං, තෙන තෙනෙව සඞ්ඛ්‍යං ගච්ඡති.** | ආන්න ඒ වගේ යම් කිසි හේතුවක් නිසා විඤ්ඤාණයක් පහළ වේද ඒ හේතුවේ නමින් තමයි විඤ්ඤාණය හඳුන්වන්නේ. |

කොස් ගහෙන් පහළ වෙච්ච ගෙඩිය කොස් ගෙඩිය, දෙල් ගහේ ගෙඩිය දෙල් ගෙඩිය වගේ. බුදුරජාණන්වහන්සේ මේ නිර්වාණයට සත්වයා ඇතුල් කරන්නේ, නිර්වාණය පැත්තට හරවන්නේ හැම වෙලාවේම හේතු ඵල ධර්ම කෙටියෙන් හෝ මධ්‍යම වශයෙන් හෝ විස්තාර වශයෙන් හෝ ප්‍රකාශ කරමින්. ඊළඟට බුදුරජාණන්වහන්සේ ශරීරය දක්වලා භික්ෂූන්වහන්සේලාගෙන් මෙසේ ප්‍රශ්න කරනවා.

| | |
|---|---|
| **''භූතමිදන්ති , භික්ඛවෙ, පස්සථා''ති?** | ''මහණෙනි මේ සිදුවෙලා තිබෙන දේ දකිනවද? මේ පංචස්කන්ධය පේනවද''? |
| **''එවං, භන්තෙ''.** | ''පේනවා ස්වාමිනි'' |
| **''තදාහාරසම්භවන්ති, භික්ඛවෙ, පස්සථා''ති?** | ඒක පහළ වෙලා තිබෙන්නේ ආහාර හේතුවෙන් බව දන්නවද? |
| **''එවං, භන්තෙ''.** | ''එහෙමයි ස්වාමිනි'' |
| **''තදාහාරනිරොධා යං භූතං, තං නිරොධධම්මන්ති, භික්ඛවෙ, පස්සථා''ති?** | '' ඒ ආහාරය නැති වෙන විට ඒ හටගත් දේ නැති වෙන බව දකිනවද''? |
| **''එවං, භන්තෙ''.** | 'එහෙමයි ස්වාමිනී දකිනව'' කියලා භික්ෂූන්වහන්සේලා පිළිතුරු දෙනවා. |

බුදුරජාණන් වහන්සේ ඊළඟට පංච උපාදානස්කන්ධය පිළිබඳව එය වෙනස් වී යන ආකාරයත් එය හේතුවකින් හටගෙන තිබෙන ආකාරයත් කියලා දෙනවා. බුදුරජාණන්වහන්සේ සාති කියන භික්ෂුවගේ ඒ දෘෂ්ඨියට පහර දෙනවා පමණක් නොවෙයි උන්වහන්සේ ඒක උපයෝගී කරගෙන විශේෂ ධර්ම කාණ්ඩයක් මතු කරලා ගන්නවා. ඒක තමයි බුදුරජාණන්වහන්සේගේ කරුණා ගුණය.

<u>ප්‍රශ්නයක්</u> - ස්වාමීන්වහන්ස සිත් 89 දෙපස් විඤ්ඤාණය අයින් උනහම තව සිත් 79 තිබෙනවා. ඒවා අයිති වෙන්නේ මනෝ විඤ්ඤාණයටද?

<u>පිළිතුර</u> - දෙපස් විඤ්ඤාණය කියලා කියන්නේ

1. කුසල විපාක අකුසල විපාක වශයෙන් චක්ඛු විඤ්ඤාණ දෙකක් තිබෙනවා.
2. කුසල විපාක අකුසල විපාක වශයෙන් සෝත විඤ්ඤාණ දෙකක් තිබෙනවා.
3. කුසල විපාක අකුසල විපාක වශයෙන් ඝාණ විඤ්ඤාණ දෙකක් තිබෙනවා.
4. කුසල විපාක අකුසල විපාක වශයෙන් ජිව්හා විඤ්ඤාණය දෙකක් තිබෙනවා.
5. කුසල විපාක අකුසල විපාක වශයෙන් කාය විඤ්ඤාණය දෙකක් තිබෙනවා.

මෙතැන ඔක්කොම තිබෙනවා විඤ්ඤාණ 10 ක්. ඒ විඤ්ඤාණ 10 හැර අභිධර්ම විග්‍රහය අනුව බැලුවහම තව තිබෙනවා සිත් 79. දැන් අපි ඉස්සෙල්ලා කියපු දහයේ තිබෙන්නේ චක්ඛු සෝත ඝාණ ජිව්හා කාය විතරයි. මනස ගැන කියලා කියලා නෑ. අනිත් සිත් 79 ඔක්කොම ටික **'මනෝධාතු'** සහ **'මනෝ විඤ්ඤාණ ධාතු'.**

ඒ **මනෝ ධාතු** සහ **මනෝ විඤ්ඤාණ ධාතු** වෙන නම් වලින් තමයි හඳුන්වන්නේ. ඒකට මනෝ විඤ්ඤාණය කියලා කියන්නේ නෑ. ඒක නිසා මිනිස්සුන්ට **මනෝ විඤ්ඤාණය** කියන එක පටලැවෙනවා. මිනිස්සුන්ට confusion එකක් ඇතිවෙනවා. ඒක හොඳ නෑ.


දැන් බලන්න **සෝමනස්ස සහගත දිට්ඨි ගත සම්ප්‍රයුක්ත අසංඛාරික සිත මනෝ විඤ්ඤාණයක්**. ඒ අකුසල් සිත් 12 පළවෙනි ලෝභ මූල සිත මනෝ විඤ්ඤාණය නමින් නොවෙයි එතැන පෙනී හිටින්නේ. කුසල් සිතුත් මනෝ විඤ්ඤාණ. ධ්‍යාන සිතුත් මනෝ විඤ්ඤාණ.

<u>ප්‍රශ්නය -</u> ස්වාමීන්වහන්ස චක්ඛු විඤ්ඤාණය කියන එක පහළ වෙන්න ඇසයි රූපයයි මනසයි තුනම එකතු වෙලා නේද විඤ්ඤාණය ඇති වෙන්නේ **'තිණ්ණං සඞ්ගති ඵස්සො'** කියන තැන..?

<u>පිළිතුර</u> - ඒක තමයි විඤ්ඤාණය කියලා කියන්නේ. **චක්ඛුඤ්ච පටිච්ච රූපෙ ච** කියලා ඒ දෙක නිසා පහළ වෙන තුන්වෙනි කෑල්ල තමයි **විඤ්ඤාණය** කියලා කියන්නේ. එතැන තුනක් තිබෙනවා. ඇසයි රූපයයි හිතයි. ඒ තුන්දෙනාගෙන් හිත නම් කරන්නේ හේතුවක් එක්කාසු කරලා = **චක්ඛුඤ්ච පටිච්ච රූපෙ ච උප්පජ්ජති චක්ඛුවිඤ්ඤාණං. තිණ්ණං සඞ්ගති ඵස්සො. ඵස්සපච්චයා වෙදනා.**

පළමුවෙනි කොටස අවසානයි. තෙරුවන් සරණයි!

සාධූ! සාධූ! සාධූ!



ඉහත සඳහන් ධර්ම දේශනාව අති පූජ්‍ය හන්තේ ජිනාලංකාර ස්වාමීන්වහන්සේ විසින් දේශිතයි.